# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි

# පරිගණක දෘඩාංග, පර්යන්ත උපාංග සහ කාර්යාලයීය උපකරණ ප්‍රසම්පාදනය කිරීම

කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා විසින් පරිගණක දෘඩාංග, පර්යන්ත උපාංග සහ කාර්යාලයීය උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

ලංසුකරුවන්හට ලංසු ලේඛනයෙහි දක්වා ඇති පරිදි තනි කොටසක්, කොටස් කිහිපයක් හෝ සියලුම කොටස් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

| අනු අංකය | කොටස් අංකය | අවශ්‍ය ද්‍රව්‍ය / උපකරණ | ලංසු ඇපකර වටිනාකම (වලංගු කාලය දින 119) |
|---|---|---|---|
| 1 | 1 වන කොටස | ලැප්ටොප් පරිගණක 45 ක් සහ ඩෙස්ක්ටොප් පරිගණක 11 ක් | රු. 250,000 |
| 2 | 2 වන කොටස | මුද්‍රණ යන්ත්‍ර 24 ක් සහ ඡායා පිටපත් යන්ත්‍ර 06 ක් | රු. 75,000 |
| 3 | 3 වන කොටස | මොනිටර් 14 ක්, UPS උපකරණ 20 ක් සහ HDMI කේබල් 12 ක් | රු. 10,000 |

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙහි පරිපාලන සහ ආයතන කටයුතු අංශය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන **රු.4,000.00 ක** ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව **2026.08.28** දින සිට **2026.09.11** දින දක්වා රජයේ වැඩ කරන දිනවලදී **පෙ.ව.9.00** සිට **ප.ව. 2.00** දක්වා ලංසු ලිපි ලේඛන ලබාගත හැක.

ලංසුකරුවන්ට මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම, ලංසු ලිපිලේඛන පරීක්ෂා කිරීම හා ලබා ගැනීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙහි පරිපාලන හා ආයතනික කටයුතු අංශයෙන් සිදු කළ හැක.

මුද්‍රා තබන ලද ලංසු කවරයෙහි ඉහළ වම් කෙළවරේ " **පරිගණක දෘඩාංග, පර්යන්ත උපාංග සහ කාර්යාලයීය උපකරණ ප්‍රසම්පාදනය කිරීම** " යනුවෙන් සඳහන් කර **2026.09.14** දින **ප.ව. 2.00 ට** හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08,** වෙත ලියාපදිංචි තැපැල මඟින් එවීම හෝ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙහි පරිපාලන හා ආයතන කටයුතු අංශයෙහි තබා ඇති ලංසු පෙට්ටියෙහි බහාලීම සිදු කළ යුතුය. ලංසු භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම ලංසුකරුවන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත,**
**කොළඹ 08.**